www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ආර්ථිකය "අවසානයක් දක්නට නැති" ආර්ථික ව්‍යාධියකට මුහුනපා ඇතැයි අර්ථශාස්ත්‍රඥ ජෝසෆ් ස්ටිග්ලිස්ට් පවසයි

## Economist Joseph Stiglitz warns of malaise "with no end in sight"

**පෝල් මිචෙල් විසිනි**

**2010 ඔක්තෝබර් 12**

"ජපාන වර්ගයේ අවසානයක් දක්නට නැති ව්‍යාධියකට" ලෝක ආර්ථිකය මුහුනපා සිටින බවට ප්‍රමුඛ පෙලේ අර්ථශාස්ත්‍රඥයෙක් වන ජෝසෆ් ස්ටිග්ලිස්ට් මේ සතියේ සන්ඩේ ටෙලිග්‍රාෆ් පුවත්පතෙහි ලිපියක් තුල සටහන් කලේය. තත්වය වඩාත් නරක අතට හරවා ඇත්තේ, ජපානයේ "අහිමිවූ දශකය" තුල දක්නට ලැබුනු වර්ගයේ මන්දගාමී වර්ධනය සමග අතිනත ගත් පහත අගයකින් යුත් විරැකියාව හා ඉහල "සමාජ සමඟිය" දැන් දක්නට නොලැබීමයි. ස්ටිග්ලිස්ට් වනාහි එක් අවධියකදී ලෝක බැංකුවේ ප්‍රධාන අර්ථශාස්ත්‍රඥයා හා ක්ලින්ටන් පරිපාලනයේ උපදේශකයෙකු ද වූ අතර දැන් ස්ටැන්ෆර්ඩ් විශ්ව විද්‍යාලයේ අර්ථශාස්ත්‍රය පිලිබඳ මහාචාර්යවරයෙකි. ඔහු මෙසේ පැවසීය. "මැත අනාගතය බලාපොරොත්තු සුන් කරන චිත්‍රයක් ලෙස දැකිය හැක."

ඔහු සිය අදහස් පල කලේ, ඔක්තෝබර් 14 දින නිකුත්කිරීමට නියමිත ඔහුගේ *වේගී පතනය: නිදහස් වෙලඳපොල හා කිඳා බහින ගෝලීය ආර්ථිකය* යන කෘතියේ ලාභදායී සංස්කරනය නිමිත්තෙන්ය. "සිදුවීම් බලාපොරොත්තුවූ ආකාරයෙන් (කනගාටුදායකය) දිගහැරී නැත්තේ" කෙසේදැයි ඔහු විස්තර කරයි. "වර්ධනය පවතින්නේ මන්දගාමීවය. සැලකිය යුතු පිපිහලු ගතියකින් යුක්තව විරැකියාව, දඩබ්බර ලෙස ඉතා ඉහලය. උකස් වෙන්දේසියේ දැමීම යුහුසුලුව සිදුවෙයි. බැංකු ඇපදීම්වල අපේක්ෂිත අරමුන නය යථා තත්වයට පත්කිරීම වූ නමුදු බැංකු ප්‍රසාද දීමනා හා ලාභ සුරක්ෂිත කර ඇතත් නය සැපයුම එසේ වී නැත."

"තවත් අර්බුදයක් ලඟ ලඟම පැමිනීමේ හැකියාව නොවැදගත්වන තාක් දුරට, බැංකුවල ප්‍රෝඩාකාරී හා සදාචාරාත්මක නොවන භාවිතාවන් " මඟින් නව රෙගුලාසි දියකර හැරීමට හැකිවූ ආකාරය ස්ටිග්ලිටස්ට් විවේචනය කරයි.

"අප කර ඇත්තේ ඊලඟ අර්බුදය තෙක් වැඩිපුර සුලු කාලයක් මිලට ගැනීම පමනි" ඔහු බැරෑරුම් ලෙස සඳහන් කලේය.

මූල්‍යමය වශයෙන් නොතකන සුලු "සිහින ලෝකයක" ජීවත්වන බවට ස්ටිග්ලිස්ට් පෞද්ගලික අංශයට හා ආන්ඩුවලට ද දොස් පවරන අතර, ග්‍රීසිය හා ස්පාඤ්ඤය වැනි රටවල් වෙලාගත් "දුරදිග නොදකින" අයවැය හිඟය කැපීමේ ප්‍රතිපත්ති හා කප්පාදු වැඩ සටහන් පිලිබඳව වෝල් විදියට හා මූල්‍ය වෙලඳපොලවලට දෙහි කපයි. මෙම පිලිවෙත් නිසා අර්බුදය, වර්ධනය පහත වැටීම, විරැකියාව වැඩි වීම මෙන්ම බදු ආදයම් හා වෙනත් ආදායම් පහත වැටීම මඟින් වඩාත් උග්‍ර අතට හරවා තිබේ. සමහරවිට ස්පාඤ්ඤය, යන්තම් දශකයකට පෙර සිය නය පැහැරහැරීමත් සමඟ ආර්ජන්ටිනාව වෙලාගත් මාරක සර්පිලය වැනි තත්වයක් කරා ඇදී යමින් තිබේ. සමපේක්ෂකයන්ගේ ප්‍රහාරයට ගොදුරුවීමට පෙරාතුව මෙය කාලය පිලිබඳ ප්‍රශ්නයක් පමනි.

උද්ධමනය හා ජාතික නයගැතිකම පිලිබඳව දැනට මූල්‍ය වෙලඳපොලවල් වැඩි වැඩියෙන් සැලකිල්ල යොමුකිරීම අයුක්තිසහගත බවට ඔහු අනතුරු අඟවයි. එය තුඩුදෙන්නේ ආර්ථිකයට ප්‍රකෘතිමත් වීම සඳහා කාලයක් ලැබීමට පෙර පොදු පිරිවැය කැපීම සඳහා තව තවත් පීඩනය යෙදීමටය. ඒ වෙනුවට ස්ටිග්ලිස්ට් ඉල්ලා සිටින්නේ, මූල්‍ය උත්තේජක පියවරයන්ය. 2008 වසරේදී චීනය එවන් පියවරක් අනුගමනය කිරීම නිසා ප්‍රබලම ආර්ථික ප්‍රකෘතියක් අත්කරගත් බව ඔහු පෙන්වා දෙයි. එහෙත් චීනයේ ආර්ථික වර්ධනය සැලකියයුතු තරම් මන්දගාමී වන බවට දැනටමත් සලකුනු දක්නට ලැබෙයි. එරට තියුනු හැකිලීමක් දෙසට ලංවෙමින් සිටින බවට වැඩෙන බියක් පවතියි. එරට නිර්යාත වෙලඳපොලවල් මත පැනවෙන කුමන හෝ සීමාවකට එය විශේෂයෙන්ම ගොදුරුවනු ඇත.

ස්ටිග්ලිස්ට්, ආර්ථික ගැටලුවලට මුහුනපාන

රටවලට උපකාර කිරීම සඳහා යුරෝ කලාපය නිදහස් අරමුදලක් පිටුවිය යුතු යයි ඔහු ඉල්ලා සිටින නමුත් වත්මන් අර්බුදය හමුවේ යුරෝවේ පැවැත්ම ගැන ඔහුට විශ්වාසයක් ඇත්තේ නැත. ඔහු යෝජනා කරන එක් විසඳුමක් නම් එක්කෝ ජර්මනිය යුරෝ කලාපයෙන් ඉවත්විය යුතුය නැත්නම් කලාපය දෙකට බෙදිය යුතුය යන්නයි. අපාලිත නිදහස් වෙලඳපොල පිලිබඳ සංකල්පය අපකීර්තියට පත්ව "නව හීලෑ කල ධනවාදයක් හා නව වඩා සමතුලිත ගෝලීය ආර්ථික පර්යායක්" නැඟීආ හැකි "අර්බුදයේ හිනිපෙත්තේදී ජාතික හා අන්තර්ජාතික එකමුතුවක මෙහොතක්"යයි සලකන ලද 2008 වෙත ඔහු උකටලී ලෙස යලි හැරී බලයි.

ඒ වෙනුවට ස්ටිග්ලිට්ස්, "හාත්පස පැතිරගිය අර්බුදයේ මුල් මාස ඉක්මනින්ම මැකී යමින් තිබේ. ඒ තැන ගත්තේ අපේක්ෂා භංගයේ මනෝභාවයකිඃ ප්‍රකෘතිමත්වීමේ මාවත මා සිතුවාටත් වඩා මන්දගාමී හා සමාජ ආතතීන් ඊටත් වඩා බලගතු විය හැකිය. බැංකු විධායකයින් ඉලක්කම් හතේ ප්‍රසාද දීමනා ගෙදර ගෙනියද්දී සාමාන්‍ය පුරවැසියන් දිග්ගැස්සෙන විරැකියාවට පමනක් නොව, මහා පසුබෑමේ අභියෝගයන්ට අලගු තැබීමටවත් නොසරිලන විරැකියා රක්ෂන ආවරන සහිත තත්වයකට මුහුනපා සිටියි.

ආර්ථික අර්බුදයට ප්‍රතිචාර වශයෙන් ජාත්‍යන්තර සම්බන්ධීකරනයක් සඳහා දරන ලද උත්සාහය, 1930 ගනන්වල ආර්ථික යුද්ධ සිහිගන්වන මූල්‍ය හා වෙලඳ ප්‍රතිපත්ති මගින් කඩා බිඳ දමා ඇතැයි ස්ටිග්ලිට්ස් කියන විට එය සත්‍යයකි. එහෙත් 2008 වසරේ පවා, බැංකු ඇපදීම්, ගෝලීය මූල්‍ය වෙලඳපොලවල් සඳහා නව නියාමනයන් හා මූල්‍ය ආයතන මත ජාත්‍යන්තර පාලනය පිලිබඳ විවාද මධ්‍යයේ ආර්ථික වාසි, බලය හා ලාභ සඳහා කටුක අරගලයක් කෙරීගෙන ගියේය. කිසිදු ආන්ඩුවක් සිය ජාතික මූල්‍ය හා ආර්ථික ආසක්තයන්, ජාත්‍යන්තර ඒකාබද්ධතාවයේ මූලධර්මය වෙනුවෙන් කැපකිරීමට ඇත්තටම සූදානම් නැත.

එක්සත් ජනපදය සිය පාර්ශවයෙන්, කප්පාදු පියවර යුරෝපය තුල පහත් වර්ධනයකට හෝ පසුබෑමකට පවා තුඩුදිය හැකි බවටත් නිර්යාත වෙලඳපොලවල් වැනසී යාමටත් ආන්ඩුවල හදිසි වියදම් කැපීම ගෝලීය "ප්‍රතිප්‍රාප්තිය" ට තර්ජනයක් විය හැකි බවටත් බියට පත්විය. අනෙක් අතට, නව නියාමනයන් සඳහා කෙරුනු ප්‍රන්සයේ හා ජර්මනියේ ඉල්ලීම්, ලෝකයේ වැදගත්ම මූල්‍ය මධ්‍යස්ථාන දෙක වන වෝල් වීදිය හා ලංඩන් නගරයට එරෙහි ඔවුන්ගේම ආර්ථික අවශ්‍යතා පෙරටුකොටගත් බව වටහාගනු ලැබිනි. ස්ටිග්ලිස්ට් සිය මැතුරුම අවසන් කරන්නේ, විරැකියාව හා සමස්ත ඉල්ලුමේ අඩුව පිලිබඳ සැබෑ ගැටලු විසඳගැනීම පිනිස කේනීසියානු ආර්ථිකයේ මූලධර්ම වෙත පිය නැඟිය යුතු බව ප්‍රකාශ කරන අතර, නැතහොත් "ලෝකය දිග්ගැස්සෙන පසුබෑමකට ගොදුරුවන" බවට අනතුරු අඟවමිනි.

ස්ටිග්ලිස්ට අනුව අර්බුදය, බැංකුකරුවන්ගේ "අදූරදර්ශී" හා "වැරදි ප්‍රතිපත්ති" වල ප්‍රතිවිපාකයකි. කෙසේ වෙතත්, අර්බුදයට හේතුව පාරිභෝගිකවාදය යටතේ, සමස්ත ඉල්ලුමේ අඩුව ලෙස දැක්වීමට වෑයම් කරන ඔහුගේ අදහස් වලින් වත්මන් ගෝලීය මහා ආර්ථික සුලිය විස්තර කල නොහැකිය. කේනීසියානු ප්‍රතිකර්ම වලට ධනේශ්වර ආර්ථිකයේ පිරිහෙන සෞඛ්‍යය තත්වය යලි කැඳවාගත නොහැකිය. මක්නිසා ද යත්, කම්කරු පන්තිය වෙතින් උකහා ගන්නා අතිරික්ත වටිනාකමට සම්බන්ධිතව ප්‍රාග්ධනයේ අමතර සමුච්ඡය මගින් නිර්මානය කර තිබෙන අත්‍යවශ්‍ය ගැටලුවට එයින් විසඳුමක් නොලැබෙන හෙයිනි. ප්‍රාග්ධනය මෙය විඳගැනීමට බලන්නේ, ආර්ථික පසුබෑම, වෙලඳ යුද්ධ හා අවසානයේදී මිලිටරි ගැටුම් තුලින් ප්‍රාග්ධනයේ සමස්ත පදාසයන් අතුගා දැමීමෙන් ද කම්කරු පන්තිය සූරාකෑම උත්සන්න කිරීමෙන් ද ය.

මෙම දශකය මුල හා 1990 ගනන්වලදී සිදු කලාක් මෙන් දැවැන්ත මුදල් සම්භාරයක් ආර්ථිකය තුලට එන්නත් කිරීමෙන් ද්‍රවශීලතාව ප්‍රසාරනය කලහොත්, පුනර්ජීවනයක් අත්කරගත හැකිවේ යයි බලාපොරොත්තු විය. කෙසේ වෙතත්, මෙම ප්‍රතිකර්ම අසාර්ථකවූ අතර අර්බුදය වඩාත් නරක අතට හැරුනි. ස්ටිග්ලිස්ට්ගේ ලේඛනය වනාහි, කටුක කප්පාදු වැඩ සටහන් හා ප්‍රාග්ධනයේ ප්‍රචන්ඩ ක්‍රියාකාරිත්වය මඟින් ලාභ පද්ධතියේ සමාජ ස්ථාවරත්වය හා සමවාය පිලිබඳව ඇතිකරන දැවැන්ත ප්‍රතිවිපාක සම්බන්ධයෙන් ගෝලීය මූල්‍ය ප්‍රාග්ධනයේ ප්‍රමුඛ නියෝජිතයන්ට කෙරෙන ආයාචනයකි. පසුගිය සති අන්තයේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා ලෝක බැංකුව රැස්වීම පැවැත්වූයේ, ධනේශ්වර ක්‍රමයේ පද්ධතිගත අර්බුදය පිලිබිඹු කරමින් නැගී එන මූල්‍ය හා වෙලඳ ගැටුම් හමුවේය. සිය අපනයනයන්ගේ සාපේක්ෂ වටිනාකම පහත දමාගැනීමේලා ලාභ ඩොලර් ප්‍රතිපත්තියක් ගෙනයමින් සිය පිලිමලුන්ට එරෙහිව වාසි ලබාගැනීම සඳහා එක්සත් ජනපදය මෙම අර්බුදය ගසාකයි. එක්සත් ජනපද පීඩනයට ප්‍රතිරෝධය පාන චීනය හා වක්‍රාකාරයෙන් ජපානය හා ජර්මනිය වැනි අතිරික්තයක් සහිත රටවල් එල්ල කරගෙන එක්සත් ජනපදය ජාමූඅ තුල සිය අධිකාරය පාවිච්චියට ගනිමින් සිටියි.

2008 වසරේ පටන් අර්බුදයට යටින් පවතින ගැටලු විසඳීමේ විවිධාකාර ප්‍රතිකර්ම අසාර්ථකවී ඇතුවා පමනක් නොව, එමගින් ලෝක ධනවාදයේ ප්‍රතිවිරෝධයන් උත්සන්න කර ජාතීන් අතර ආතතීන්

මෙන්ම ඒ ඒ රටවල් තුලම සමාජ අර්බුදය ද ගැඹුරු කර තිබේ.

ජාමූඅ දැන් ඉල්ලා සිටින්නේ, කම්කරු පන්තිය මත පතිත කරන රුදුරු ප්‍රහාරය දැඩි කරන ලෙසයි. හැකිලෙන ආර්ථිකය, සියයට 20 වන විරැකියාව, තාවකාලික වැඩ කොන්ත්‍රාත්තු හා සමාජ ශුභසාධන, වැටුප් හා විශ්‍රාම වැටුප් කප්පාදුව යටතේ පීඩාවට පත්ව සිටින ස්පාඤ්ඤය වැනි රටවල් සඳහා ජාමූඅ තව තවත් කප්පාදු වැඩ සටහන් ඉල්ලා සිටින අතර, කිසිදු අසාර්ථකත්වයක් වෙනුවෙන් වෙලඳපොලවල් "බිංදුවට බැස ඇති ඉවසීමක්" සහිතව ප්‍රතිචාර දක්වනු ඇතැයි අනතුරු අඟවයි.

© www.wsws.org